

# ශ්‍රී ලාංකික සමාජය හා සාම්ප්‍රදායික සිරිත්

විවිධ

සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න



"දස දෙසින් පුපුරන රතිඤ්ඤා හඬින්, ඈත ගමෙන් ඇසෙන රබන් පදවල සුමුදු රාවයෙන් මුළු රටටම කියා පාන්නේ ජාතික සැණකෙළියක සාඩම්බර විලාසයමය. ......" පූජ්‍ය හබරකඩ ඉන්ද්‍රරතන ස්වාමීන් වහන්සේ, "අලුත් අවුරුදු දා බුදුනුවන්ගේ වගකීම්" යන මැයෙන් පළ කළ ලිපියකින් මෙම පාඨය උපුටාගතිමි. සෑම වසරකම අප්‍රේල් මාසයේදී උදා වන සිංහල අලුත් අවුරුද්ද ශ්‍රී ලාංකික ජනතාව විසින් සමරනු ලබන ආකාරය ගැන කියවෙන මෙම අදහස ශ්‍රී ලාංකික සමාජය තුළ තවදුරටත් සාම්ප්‍රදායික සිරිත් විරිත් අඩුවැඩි වශයෙන් ක්‍රියාත්මක වන බව ඔප්පු කරලන්නකි. කවර සමා-ජයකට වුව චාරිත්‍ර වාරිත්‍ර හා සම්ප්‍රදායයන් අවශ්‍ය වනු පමණක් නොව අත්‍යවශ්‍ය වේ යයි පැවසීම සාවද්‍ය නොවේ. ආදි යුගවල පටන් මානවයා සිය දෛනික ජීවන රටාවට කිසියම් විශේෂ ක්‍රියාදාමයන්, ඇවතුම් පැවතුම් ආදිය එක් කරගනිමින් දිවි ගෙවීමට පුරුදුව සිටි බව පැහැදිලිය. ආගම්වල ප්‍රභවය පිළිබඳව සොයා බැලීමේදී,

"බහුං වේ සරණං යන්ති . පබ්බතානි වනානි ච
ආරාම රුක්ඛ චෙත්‍යානි . මනුස්සා භය තජ්ජිතා"

යන ගාථාවෙන් කියවෙන අදහස අපට හඟවන්නේ ද, ඈත අතීතයේ සිටම මිනිසා තම චිත්ත අභ්‍යන්තරයෙහි හටගන්නා බිය දුරු කරගැන්ම සඳහා සොබා දහමේ විවිධ වස්තූන්ගේ පිහිට පැතූ බවයි. මෙලෙසින් ගත් කල්හි, අද පවා සාමාන්‍ය මිනිස් මනසට හුදෙක් විද්‍යාත්මක සත්‍යයන් අනුවම කටයුතු කිරීම ප්‍රමාණවත් නොවේ. වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, පරිගණක විද්‍යාව ආදී විෂයයන්හි පූර්ණකාලීනව නිරතව සිටින පුද්ගලයන් පවා තම ජීවිතයේ සන්ධිස්ථාන වෙනුවෙන් කරන කටයුතුවලදී සාම්ප්‍රදායයන්, සිරිත් විරිත් හා විවිධ වතාවත් අනුගමනය කරන ආකාරය දැකගත හැකිය.

සෑම පුද්ගලයකුම පාහේ සිය බුද්ධීන්ද්‍රිය අනුව මෙන්ම භාවේන්ද්‍රිය අනුව ද කටයුතු කිරීම අරුමයක් නොවේ. ජී. බී. සේනානායක නම් වූ ශ්‍රේෂ්ඨ නිර්මාණ කරුවා විසින් රචිත 'දෙවියන් මැරීම' නම් පහත සඳහන් නිසඳැස් පද්‍ය රචනාව බුද්ධිය හා හැඟීම් අතර පවත්නා තත්වය ද පැහැදිලි කරන්නකි.

බුද්ධිය, මිත්‍රයෙකැයි, සිතූ මම
දිනක් මග රැක සිට
මගේ දෙවියන්
මරා හෙළිමි.
දැවැන්තයකු වන බුද්ධිය
අඳුරෙහි මහ අඩි තබමින්
මා පිටුපසින් එනු
මට ඇසෙයි.

එහෙත් දෙවියන් සිටි කල මෙන්
දැන් මට
සැක හැර ගමන් කළ නොහැක.
මා වැටුණු කල,
දැන් දෙවියන් නැති හෙයින්
මා ම
නැගී සිටිය යුතුය.

යළිත් දෙවියන් සොයා ගිය මට
උන්වහන්සේගේ රන්වන් මළ සිරුර
මග අසල
නුග ගහ යට තිබී සම්බ විය

**මෙරට අලුත් අවුරුදු උත්සවය පිළිබඳව ඓතිහාසික තොරතුරු සොයා බැලීමේදී එහි ප්‍රභවය පණ්ඩුකාභය රජු දවස වන්නට ඇතැයි සිතිය හැකි සාක්ෂි මහවංසයෙන් සොයාගත හැකිය.**

"ස්වාමීනි, යළිත් නැගී සිට
මා හා පෙර මෙන්
එනු මැනවැ"යි මම කීමි

උන් වහන්සේ
නැගී නොසිටින්නේ
බුද්ධිය
තම දත් දෙපෙළ පෙන්නා
විළිස්සමින්
මා පිටිපස සිටින හෙයින් බව
මම දනිමි.

එහෙත් මට බුද්ධිය පලවා හැරිය නොහැක
ඔහු මා අත්හැර නොයයි"
(පලිගැනීම, 1946)

මෙම නිර්මාණයෙන් ගම්‍ය වනුයේ අධ්‍යාපනය මගින් ඉහළ බුද්ධි මට්ටමක් කරා යන කෙනකු එම බුද්ධිය, සියලු දෙයකදීම තමාට පිහිට වනු ඇතැයි යන අපේක්ෂාවෙන් හැඟීම් නැතහොත් සාරධර්ම ප්‍රතික්ෂේප කොට, ඒවායින් විරහිතව ජීවිතය ගෙන යාමට උත්සාහ ගැනීමකි. එවන් පියවරක් ගෙන සිටින අතරතුරදී හැඟීම්වලින්, සාරධර්මවලින් පිහිටක් අවශ්‍ය වන විට බුද්ධිය නමැති 'යක්ෂයා' සිය ආධිපත්‍යය පතුරුවමින් "දත් දෙපෙළ විළිස්සාගෙන" තමා පිටුපස සිටින බවය. සාමාන්‍ය ජීවිතයේදී වුව කවර පුද්ගලයකු හෝ හු-දෙක් බුද්ධියටම පමණක් ඉඩ දෙමින් ජීවත් වීම යථාර්ථය නොවේ. මිනිස් මනසට, තමන් හැදුණ වැඩුණ පරිසරයට අදාළ සංස්කෘතික සාරධර්ම හා ස්වාභාවික හැඟීම් අත්‍යවශ්‍ය වන අවස්ථා ඇත.

කවර සමාජයක් හෝ සංස්කෘතියක් හෝ ගත් විට ඊට ආවේණික වූ සාම්ප්‍රදායික සිරිත් විරිත් හා සාරධර්ම එහි පැවැත්මට අත්‍යවශ්‍ය වේ. ජපානය වැනි රටක් ගෙන බලන විට එය විද්‍යාව හා තාක්ෂණය අතින් ඉහළට ගමන් කොට ඇති ජාතියක් ජීවත් වන රටක් බව කිව හැකිය. එසේ වුවද, එම ජනතාව තමන් කාලාන්තරයක් තිස්සේ දැන හඳුනාගෙන සිටි, තමන්ගේ ජීවිතවලට රසවත් බවක් මෙන්ම සුන්දරත්වයක් ද ගෙන දුන් පාරම්පරික සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් නූතනත්වය සමග සමාන්තරව ඉදිරියට පවත්වාගෙන යන ආකාරය එම සංස්කෘතිය සතු විවිධාකාර උත්සව හා චාරිත්‍ර වාරිත්‍ර මගින් පිළිබිඹු වෙයි.

ශ්‍රී ලාංකික සමාජය විෂයයෙහි ද මෙම තත්වය බොහෝ දුරට සමානය. වර්තමාන සිංහල සමාජය, පවුල් වශයෙන් වෙන් කොට ගත්තත්, දරුවන්ගේ අධ්‍යාපනය හා රැකීරක්ෂා විෂයයෙහි ගෙන බැලුවත් තාක්ෂණය අතින්, විශේෂයෙන්ම පරිගණක තාක්ෂණය අතින් ඉදිරියට ගමන් කරන වේගය සෑහෙන තරම් ශීඝ්‍ර බවක් පෙන්නුම් කරයි. එබඳු වාතාවරණයක් තුළ වුවද සිංහල ජනතාව සිය දේශීය සිරිත් විරිත් හා සාම්ප්‍රදායික උත්සව පෙර පැවති ආකාරයෙන්ම නොවුවත් තරමක් දුරට හෝ ඊට සමානව ඉටු කර ලීමට වෙහෙස දරන බව පසුගිය දා පැවැත්වුණු සිංහල අලුත් අවුරුද්ද වැනි උත්සව අවස්ථාවලින් ප්‍රකට වෙයි.

සිංහල අලුත් අවුරුද්ද, වසරේ අප්‍රේල් මාසයට යෙදෙන අතර බක් මාසය නමින් හැඳින්වෙන මෙම කාල සීමාව භාග්‍යවන්ත කාලයක් ලෙස ද හැඳින්වෙයි. ස්වභාව ධර්මය අමුතු පිබිදීමක් පෙන්නුම් කරන වසන්තය උදා වන මෙම කාල සීමාවේදී අවට පරිසරය මෙන්ම පුද්ගලයන්ගේ සිත් සතන් ද අමුතුම උද්යෝගයකින් පිනා යන ආකාරය දැකගත හැකිය. සිංහල අලුත් අවුරුද්ද සමරනු ලබන දින වකවානුවලදී ශ්‍රී ලාංකික දෙමළ ජනතාව ද තමන්ට ආවේණික වූ සිරිත් විරිත් හා සම්ප්‍රදායයන් ඉටු කිරීමට යොමු වන බැවින් අද බොහෝ දෙනා මෙය සිංහල දෙමළ අලුත් අවුරුද්ද හෝ සිංහල හින්දු අලුත් අවුරුද්ද යනාදී වශයෙන් නිරවද්‍ය ලෙස හෝ සාවද්‍ය ලෙස භාවිත කිරීමට යොමු වී ඇත.
සිංහල ගැමි සමාජය අලුත් අවුරුද්ද සැමරීමට ලකලෑස්ති වන්නේ වසරේ තුන්වන මාසයේ පමණ සිටය. ගැමි නිවසක ගෙවත්තේ කෙසෙල් ගසක කෙසෙල් කැනක් මතු වනු දකින ගැමි මවක් සතුටින් ඉපිළෙමින් සිය පවුලේ සාමාජිකයන් සමග පවසන්නේ, "අවුරුද්දට කන්න හොඳයි" යනුවෙන් ප්‍රීතිමත් හැඟීමකිනි. අවුරුද්ද ළං වෙද්දී මුළු ගැමි පරිසරයම අමුතු උද්යෝගයකින් යුතුව සූදානම් වන ආකාරය එදා ගැමි දරුදැරියන් ලෙස හැදුණ වැඩුණ අපගේ මනස තුළ තවමත් සිතුවම් වී පවතී. කොහාගේ නාදය මුළු ගමටම කියන්නේ සිංහල අවුරුද්ද ළඟ ළඟම එන බවයි. සැබෑ වසන්ත සිරිය පෙන්නුම් කරමින් ගස්වැල්වල දලු ලමින් සශ්‍රීකත්වයක් ප්‍රකට කරවන විට ගම තුළ ජීවත් වන ජනතාව ද සතුටින් මෙන්ම සහෝදරත්වයකින් ද එකිනෙකා හා බැඳෙනු ඇත.

ගම්මැද්දේ අවුරුදු සෙල්ලම් සඳහා කටයුතු සූදානම් වෙද්දී තම තමන්ගේ නිවෙස්වල උස ගසක බඳින ලද ශක්තිමත් කඹයකින් වැඩිහිටියන් විසින් සාදා දෙනු ලබන ඔන්චිල්ලාව ගැමි දරුවනට අවුරුදු සිරිය විඳ ගැන්මට ආරම්භය සකසා දෙයි. සිංහල අවුරුද්ද ළං වන විට ගැමි ගැහැනිය තම නිවසේ කවර හෝ ස්ථානයක බිත්තියේ එල්ලා ඇති විශාල රබාන එළියට ගනිමින් අවශ්‍ය විට වාදනය සඳහා එය රත් කර ගන්නට සූදානම් කොට තබයි.

සිංහල අලුත් අවුරුද්දෙන් වඩාත් සතුටට පත් වන්නේ ගැමි දරු දැරියන් බව අමුතුවෙන් කිවයුතු නොවේ. එළඹෙන අලුත් අවුරුද්දේදී සියල්ල අලුත් වන අතර තමන්ට ලැබෙන අලුත් ඇඳුම් පැලඳුම් ගැනත්, වෙනදා නොලැබෙන අන්දමේ නිදහසක් ඇති හෙයින් ඕනෑ තරම් ක්‍රීඩා ආදියෙහි නිරත වීමට ලැබෙන අවස්ථාව ගැනත් ඔවුන්ගේ සිත්සතන් ප්‍රීති ප්‍රමෝදයෙන් ඉපිල යන කාල සීමාවක් ලෙස ද සිංහල අලුත් අවුරුදු සමය සැලකිය හැකිය. පාසල් නිවාඩු කාලයත් සමග පොතපතේ පාඩම් වැඩවලින් තාවකාලිකව විශ්‍රාමයක් ලබන දරුවනට අවුරුදු ක්‍රීඩා, අවුරුදු කෑම සමග වෙනත් විනෝදාංශ ද අතිශයින් වැදගත් වනු ඇත.

අලුත් අවුරුද්ද වැනි ජාතික උත්සව පවත්වන ශ්‍රී ලාංකික ජනතාව එමගින් තමන් සතු පාරම්පරික සිරිත් විරිත් ඉදිරි පරපුරට දායාද කිරීමක් ද මෙහිදී සිදු වෙයි. සාමාන්‍යයෙන් ලොව කවර රටක වුවද සම්ප්‍රදායයන් හා සිරිත් විරිත් මතු පරපුර වෙත දායාද කරනු ලබන්නේ වැඩිහිටි පරම්පරාව විසිනි. එලෙසින් යන ගමනේදී තරුණ පෙළ, තමන් වඩාත් යොමු වී සිටින තාක්ෂණික අංශය සමග එකී